# කර්මාන්ත අමාත්‍යාංශය

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

# තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකාර - ITC Manager

කළමනාකාර සේවා ශ්‍රේණිය (MM-1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු - 01

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ ඒ හා සමාන උපාධියක්

**සහ**

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.**

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් පුරා තිබීම.

(2) කනිෂ්ඨ කළමනාකාර (JM-1-2) සේවා ශ්‍රේණියෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහ (5) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM-1-1, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

**කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව**

වැටුප් කේත අංකය - MM-1-1, රු.53,175/= - 1,375X10, 1,910X15 = 95,575/-

රු. 53,175/= - වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

MM-1-1 සේවා ශ්‍රේණියේ තනතුරු සඳහා වයස් සීමාව අවුරුදු 22 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

MM-1-1 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් අමතර දීමනාවන්ද හිමිවේ.

1. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම්.
2. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රිය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

## 02. බංගලා භාරකාර (Bunglow Keeper)

ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය (PL-3)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු - 02**

බාහිර අයදුම්කරුවන් - අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

**සමග**

ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා

බංගලා භාරකාර තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.**

1) බංගලා භාරකාර - ක්ෂේත්‍රයෙහි වසර පහක (05) ක පළපුරුද්ද සහ කාර්මික / විද්‍යාලයකින් වෘත්තීය පුහුණු ආයතනයකින් බංගලා භාරකාර තනතුරෙහි කාර්යභාරයට අනුකූලවන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ශ්‍රේණියක සේවකයින්

**හෝ**

2) බංගලා භාරකාර තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

PL-3. සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

**කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව**

වැටුප් කේත අංකය ,. 26,290/= - 270X10, 300X10, 330X10, 350X12 =39,490/- රු.26,290/= වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

PL-3 සේවා ශ්‍රේණියේ තනතුරු සඳහා වයස් සීමාව - අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

**දීමනා**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු.7,800/= වන ජීවන වියදම් දීමනාව.
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරි දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු. 4,000/= වන දුෂ්කර දීමනාව.
05. මාසික නිෂ්පාදනය මත ගෙවනු ලබන නිෂ්පාදන දිරි දීමනාව
06. රු. 5,000/= වන මාසික අන්තර් දීමනාව

**ප්‍රතිලාභ**

01. වාර්ෂික නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනාව
02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
03. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    - i. වසරක් සඳහා රු. 200,000/= ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    - ii. වසරක් සඳහා රු.20,000/= ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    - iii. වසරක් සඳහා රු. 5.000/- දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
04. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම.
    - i. වසර දෙකකට වරක් රු.12,000/-ක දීමනාව ( විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, ඇස් කණ්ණාඩි හා ශ්‍රවණාධාර වියදම්)
    - ii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/= ක මුදලක් ලබාදීම.
05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
06. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද, සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
4. තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ මුළු ඉපයීම්වලින් උපයන විට ගෙවීම් බද්ද (Pay as you earn payee tax) අයකරගනු ලැබේ.

රාජ්‍ය සේවයේ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත දක්වන ලද තනතුරු සඳහා වන අයදුම්පත් (අදාළ සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත්ද සමග) ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය සරණ මාවතේ අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි සභාපති වෙත 2023.06.19 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුවේ.

**සභාපති, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,**
**අංක:341/13 සරණ මාවත, රාජගිරිය.**